# අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලය

........................................................................................................................................................................ පදිංචි

........................................................................................................................................................................ වන මා

සියල්ලන් වෙත ම දන්වා සිටින වග නම්–

මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් ඉඩමේ නිවසක් ඉදි කිරීම සඳහා මවිසින් රුපියල් ........................................................................ ක

මුදලක් ණයට ගන්නා ලදුව ඇති බැවින් ද, මවිසින් එසේ ණයට ලබා ගන්නා ලද මුළු මුදල, සියයට ........................................................ ක පොලියක් සහිතව, (මෙහි මින්පසු එකී “ජනරජය” යයි හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සේවයෙහි නියුක්ත නිලධාරියෙකු වශයෙන් මට ලැබෙන වැටුපෙන් හෝ පඩිනඩිවලින් කොටස් වශයෙන් අඩුකර ගැනීමෙන් ආපසු ගෙවිය යුතු බවට යෝජනා කොට ඇති බැවින් ද,

එකී ණය මුදල හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට ඉතිරිව තිබියදී මොනයම් හේතුවක් නිසා වුවද, එකී ජනරජය යටතේ වූ මගේ සේවය අවසන් වුවහොත්, එකී දේපොළ විකුණා ණය මුදලෙන් ආපසු ගෙවීමට එවකට ඉතිරිව ඇති මුදල එකී ජනරජයට ගෙවා ඉතිරි මුදල මට හෝ මගේ උරුමක්කාරයන්ට හෝ පොල්මෑකාරයන්ට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන්ට හෝ ගෙවීමට හැකිවන පරිදි අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරෙන සේ ඔහු නමින් වූ අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලපත්‍රයකට මවිසින් අත්සන් කළ යුතු බවට මගෙන් ඉල්ලීමක් කරන ලදුව ඊට මා එකඟ ව සිටින

බැවින් ද එකී ඉල්ලීම ප්‍රකාර ........................................................................................................................ පදිංචි

එකී........................................................................................................ වන මා, එකී රුපියල් ........................................................................ක

මුදලක් ණයට ගැනීම කරුණු කොට, මීට යා කොට ඇති උපලේඛනයේ සුවිශේෂයෙන් විස්තරව සඳහන් කොට ඇති දේපොළ ඇටෝර්නි බලකරුට නිසි යයි හෝ අවශ්‍ය යයි පෙනී යන යම් මිලකට නොහොත් යම් අන්දමකට විකිණීමට, පැවරීමට හෝ හිමි කිරීමට අදාළ අමාත්‍යාංශයේ ලේකම් වන

එමෙන්ම යාවකාලිකව එම පදවිය උසුලන ........................................................................................................................

පදිංචි ........................................................................................................................ යන අය මගේ ඇටෝර්නි

බලකරු වශයෙන් මවිසින් අවලංගු නොකළ හැකි පරිදි මෙයින් නම්කර සිටින බවත්, පත්කර සිටින බවත්, මෙම ලේඛනය සාක්ෂ්‍ය කොට ගෙන සියල්ලන් විසින් දත යුතුය.

එකී මුදල ලැබුණු කල්හි, ඉඩම් සහ දේපොළ අයිති තැනැත්තා, තමාගේ උරුමක්කාරයන්, පොල්මෑකාරයන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් හෝ එකී අයිතිකරු නොහොත් ඉහත කී අය විසින් නියම කෙරෙන වෙනත් අයකු හෝ නමින් එකී, දේපොළ පිළිබඳ සියළුම අවශ්‍ය හෝ නියමිත හිමිකරවලට සහ ආරක්ෂණවලට, මා වෙනුවෙන් අත්සන් කටයුතු වන්නේ ය.

එකී දේපොළ ද, ඒවායේ කුලී සහ ලාභ ප්‍රයෝජන ද, ඒවායෙහි හෝ ඒවා පිළිබඳ මගේ සියලුම බූදල් හිමිකම් ද, අයිතිය සහ සම්බන්ධකම් ද, එකී අයිතිකරුට, ඔහුගේ උරුමක්කාරයන්ට, පොල්මෑකාරයන්ට, අද්මිනිස්ත්‍රාසිකරුවන්ට සහ පැවරුම්ලාභීන්ට සම්පූර්ණ ලෙසත් සාර්ථක ලෙසත් පැවරීම සහ මාරු කිරීම සඳහා අවශ්‍ය යයි ද, නිසි යයි ද, අවස්ථානුරූප යයි ද, පෙනී යන වෙනත් මොනයම් ක්‍රියාවක් වුවද මෙම ඇටෝර්නි බලය පවරා නොදී තිබිය දී මම ම පැමිණ සිටියෙම් නම් මා හටම කරන්නට සිදුවෙන පරිදි යථාර්ථයෙන් ඉටු කිරීම සඳහා මෙයින් බලය පැවරේ.

තවද, ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මගේ එකී ඇටෝර්නි බලකරු විසින් සපයනු ලබන්නා වූ ද, පිළියෙල කරනු ලබන්නාවූ ද, අත්සන් තබනු ලබන්නා වූ ද, කරනු ලබන්නා වූ ද, සියලුම කුවිතාන්සි, නිදහස් කිරීම්, හිමිකර, නීත්‍යානුකූල ලේඛන සහ ආරක්ෂණ ද, කටයුතු ක්‍රියාවන් කරුණු සහ දේවල් ද, ම විසින් නිසි පරිදි පෞද්ගලිකව ඒවා හෝ ඒවාට අත්සන් තබනු ලැබුවාක් ලෙස ද, පවරනු, භාරදෙනු හෝ පිළියෙල කරනු ලැබුවාක් ලෙස ද යථාර්ථයෙන් වලංගු ලෙස ක්‍රියාත්මක ලෙස පිළිගත යුතු බව මම මෙයින් නියම කොට ප්‍රකාශ කර සිටිමි.

මිලකර ගත හැකි ප්‍රතිෂ්ඨාවක් උඩ දෙනු ලබන මෙම ඇටෝර්නි බලය, එකී ණය මුදල ආපසු ගෙවා අවසන් වන තෙක් අවලංගු කළ නොහැකි වන්නේ ය.

මෙම ඇටෝර්නි බලය ප්‍රකාර, මෙහි සඳහන් කාරණාව සම්බන්ධයෙන් මගේ එකී ඇටෝර්නි බලකරු විසින් නීත්‍යානුකූලව කරනු ලබන හෝ කරවනු ලබන කවර දෙයක් වුවද කලින් කලට මෙන්ම සියලු කල්හිම භාර ගැනීමටත් ස්ථිර කිරීමටත් මම මෙයින් පොරොන්දු වෙමි.

මීට සාක්ෂ්‍ය වශයෙන් 20.................................................... ක් වූ ........................................ මස ........................................ වැනි දින

........................................................................................ දී මවිසින් මෙහි අත්සන් තබන ලදී.

සාක්ෂිකරුවෝ :

........................................................................................
අත්සන

(1) ............................................................

(2) ............................................................

ඉහත සඳහන් උපලේඛන